සමන්තුරේ ප්‍රාදේශීය සභාව
අම්පාර දිස්ත්‍රික්කය
---------------------

1 මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
--------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 ජූලි 09 දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 මැයි 23 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 ඔක්තෝබර් 29 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට සමන්තුරේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-----------------------------------------

1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති
-------------------------

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන සමඟ හෙළිදරව් කර නොතිබුණි.

1.3.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලවීම
-----------------------------------------------------------------

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංශ 2 අනුව මූල්‍ය ප්‍රකාශන සමඟ මුදල් ප්‍රවාහ ප්‍රකාශන ඉදිරිපත් කළ යුතු වූවද, මුදල් ප්‍රවාහ ප්‍රකාශන ඉදිරිපත් කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු
-----------------------

(අ) ප්‍රාදේශීය සභාව මගින් පවත්වා ගෙන යනු ලබන පුස්තකාල හතරකට එෂියා ෆවුන්ඩේෂන් ආයතනයෙන් පරිත්‍යාග වශයෙන් ලබා දෙන ලද පොත් 635 ක වටිනාකම් සහ අම්පාර පළාත් පාලන සහකාර කොමසාරිස්ගෙන් සහ විවිධ පුද්ගලයන්ගෙන් පරිත්‍යාග වශයෙන් ලද පොත් 318 ක වටිනාකම වන රු. 105,921 ක වත්කම් ගිණුම්වල ගෙන නොතිබුණි.

(ආ) 2014 දෙසැම්බර් 31 දිනය තිබූ රු. 354,085 ක වටිනා විදුලි උපකරණ වල වටිනාකම් වත්කම් ගිණුම්වලට ගෙනවිත් නොතිබුණි.

(ඇ) ඝණ අපද්‍රව්‍ය කළමණාකරණය සම්බන්ධයෙන් කාරතිවු ප්‍රාදේශීය සභාවට අත්තිකාරම් වශයෙන් ගෙවන ලද රු. 366,444 ක මුදල වත්කම් ගිණුම්වලට ගෙනවිත් නොතිබුණි.

(ඈ) ඝණ අපද්‍රව්‍ය කළමණාකරණ සම්බන්ධයෙන් කාරතිවු ප්‍රාදේශීය සභාවට සමාලෝචිත වර්ෂයේ ජූලි සහ අගෝස්තු මාසයන් වෙනුවෙන් ගෙවියයුතු ගාස්තුව රු. 572,145 ක් වගකීම් ගිණුම්වලට ගෙනවිත් නොතිබුණි.

(ඉ) 2005 වර්ෂයේදී අස්ථානගතවූ රු. 95,670 ක් වටිනා විදුලි උපකරණ තොගය මූල්‍ය ප්‍රකාශනවල දිනට ඉතිරි තොග වශයෙන් පෙන්වා තිබුණි.

(ඊ) ලෙජරය අනුව සමාලෝචිත වර්ෂය සඳහා අයවියයුතු හිඟ බදු කුලී රු. 628,406 ක් වූවද මූල්‍ය ප්‍රකාශනවල රු. 1,522,990 ක් ලෙස පෙන්වා තිබීමෙන් අයවියයුතු කඩකාමර බදු ආදායම් රු. 894,584 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ල සහ සාතකාගාරය ගොඩනැගිල්ල සඳහාවූ ගෙවීම් වලදී අඩුකර ගන්නා ලද රැඳවුම් මුදල් පිළිවෙලින් රු. 96,317 සහ රු. 1,503,268 ක් ගෙවියයුතු හිඟ වශයෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

1.3.4 අවිනිශ්චිත ගිණුම්

--------------------

2005 වර්ෂයේ සිට දිගටම අවිනිශ්චිත ගිණුමේ බැර ශේෂයන් වශයෙන් රු. 6,210 ක් පෙන්වා තිබුණද එය හඳුනාගෙන නිරවුල් කිරීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

1.3.5 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්

------------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2003 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වාවූ කාලපරිච්ඡේදයට අයත් අයවියයුතු හිඟ මස්කඩ බදු රු. 11,921,435 ක් මුදල අයකර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂය අවසානය දක්වා කටයුතුකර නොතිබුණි.

(ආ) මහජන පොළ කඩ කාමර බදු ගත් අයගෙන් 2005 සිට 2012 දක්වා අයවියයුතු හිඟ මුදල වන රු. 1,813,278 ක මුදල සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අයකරගෙන නොතිබුණි.

1.3.5 විගණන සඳහා සාක්ෂි නොවීම

----------------------------------

මූල්‍ය ප්‍රකාශනවල පෙන්වා තිබූ එක්එක් විෂයන් ඉදිරියෙන් පෙන්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| විෂයන් | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| ඉඩම් හා ගොඩනැගිලි | 99,403,943 | ස්ථාවර වත්කම් ලේඛනය සහ ඉඩම් ඔප්පු |
| නිරවුල් නොකළ අත්තිකාරම් | 784,618 | අත්තිකාරම් ලේඛනය |
| ණය ගැති | 3,295,607 | ශේෂ සනාථ කිරීම් ලිපි සහ ණයගැති ලේඛනය |
| මස් කඩ බදු හිඟ | 14,176,939 | බදුකුලි ලේඛන |

2. මූල්‍ය සමාලෝචනය

-----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵලය

-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තික වියදම් ඉක්මවූ ආදායම් රු. 783,743 ක්වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම් රු. 17,964,998 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලවල රු. 10,779,861 ක පිරිහීමක් පෙන්නුම් කෙරිණ.

2.2 ආදායම් පරිපාලනය

-----------------------

2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

-------------------------------------

සභාපතිවරයා විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම් අයකරගත් ආදායම් අතර සැලකිය යුතු වෙනස්කම් නිරීක්ෂණය විය.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත ආදායම් | අයකළ අදායම් | අයනොකළ ආදායම් | අයනොවූ ආදයම් ඇස්තමේන්තුගත ආදායමෙන් ප්‍රතිශතයක් වශයෙන් |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | % |
| වරිපනම් බදු | 4,000,000 | 15,425,489 | 2,164,124 | 54 |
| බදු කුලි | 13,800,000 | 10,698,337 | 3,101,663 | 22 |
| රථ වාහන බදු | 15,000 | 12 | 14,988 | 100 |
| සණ අපද්‍රව්‍ය සේවා ගාස්තු | 2,500,000 | 384,069 | 2,115,931 | 85 |
| මුද්දර ගාස්තු | 24,821,402 | 9,017,058 | 15,804,344 | 64 |

2.2.2 වරිපනම් හා බදු

-----------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 1987 අංක දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තිය අනුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ තිබෙන ඉඩම් සහ ඉදි කරන ලද නිවාස, ගොඩනැගිලි සඳහා 2005 වර්ෂ සිට 2013 වර්ෂය අවසානය දක්වා අයවියයුතු එකතුව රු. 7,922,708 ක්වූ වරිපනම් වලින් 11% ප්‍රමාණයක් වන රු. 872,688 ක් පමණක් සමාලෝචිත වර්ෂයේ අයකරගෙන තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අයවැය ලේඛන අනුව, අයකිරීම් සඳහා ඇස්තමේන්තු කරන ලද වරිපනම් බදු රු. 3,887,719 කි. ඉන් මුදලින් 13% වන රු. 505,403 ක් පමණක් අයකර තිබුණි.

2.2.3 බලපත්‍ර ගාස්තු

----------------

2003 වර්ෂය සිට 2005 වර්ෂ අවසානය දක්වා අයකරගතයුතු බලපත්‍ර ගාස්තු රු. 142,669 ක මුදල සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

2.2.4 දැන්වීම් පවරු ගාස්තු අයකිරීම්

----------------------------------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තියේ (vii)(8) සහ (xxx) උප වගන්ති සහ 1644 අංක දරන 2010 මාර්තු 05 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් නිවේදනය අනුව සභා බල ප්‍රදේශයේ පුද්ගලික අයතනවලින් තමන්ගේ වෙළද භාණ්ඩ ප්‍රචාරය කිරීම සඳහා ඉදිකරතිබූ දැන්වීම්පුවරු 13 ක් වෙනුවෙන් අයකරගත යුතු බලපත්‍ර ගාස්තු රු. 158,020 ක 2015 සැප්තැම්බර් 02 වන දිනය දක්වා අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි.

2.2.5 සන්නිවේදන කුළුනු සඳහා ගාස්තු අයකිරීම්

2010 මාර්තු 05 දින 1644 අංක දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් නිවේදනය අනුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශවල 2009 වර්ෂයෙ සිට 2013 වර්ෂය දක්වාවූ කාල පරිච්ඡේදවල ඉදිකරන ලද සන්නිවේදන කුළුනු 03 ක් වෙනුවෙන් අයවියයුතු රු. 168,000 ක බලපත්‍ර ගාස්තු 2015 සැප්තම්බර් 02 වන දින දක්වා අයකිරීමට කටයුතු කර නොතිබුණි.

2.2.6 උසාවි දඩ සහ මුද්දර ගාස්තු

(අ) විවිධ ආඥා පනත් යටතේ මහේස්ත්‍රාත් උසාවියෙන් 2014 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු. 296,082 ක මුදල ගණනය කර පළාත් සභාවේ ප්‍රධාන ලේකම්ගෙන් අයකර ගැනීම සඳහා අදාල කාල පරිච්ඡයේදී කටයුතු කර නොතිබුණි.

(ආ) 2013 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා ලැබියයුතු මුද්දර ගාස්තු රු. 1,903,023 ක මුදල රෙජිස්ටාර් ජනරාල් වරයාගෙන් අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි.

3 මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ දූර්වලතා

(අ) සභාව විසින් අළුතෙන් ඉදිකරන ලද සාතකාගාරයට ජල සම්බන්ධතා ලබා ගැනීම සඳහා ජාතික ජල සම්පාදන හා ජල පවාහන මණ්ඩලය විසින් ඉදිරිපත් කරන ලද ඇස්තමෙන්තුවේ දක්නට ලැබූ සමහර ගණනය කිරීමේ වැරදි නිසා රු. 415,908 ක් වෙනුවට රු. 474,093 ක් ලෙස ඇස්තමෙන්තු සකස්කර තිබුණි. මේ සම්බන්ධයෙන් අවධානය යොමු නොකර ගෙවීම නිසා ජාතික ජල සම්පාදන හා ජල පවාහන මණ්ඩලයට රු. 58,185 ක් වැඩියෙන් ගෙවා තිබුණි.

(ආ) 2013 වර්ෂයේ අවසානය දක්වා තැන්පත් ගිණුමේ දක්වා තිබූ වැට් බද්ද සහ රඳවා ගැනීමේ බදුවල එකතුව රු. 7,244,750 ක මුදලින් රු. 5,659,975 ක් දේශිය ආදායම් කොමසාරිස් වෙත ප්‍රේෂණ නොකර සමාලෝචිත වර්ෂයේ සභාවේ ආදායම් ගිණුමට මරුකර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයේ 2015 ජුනි 06 දින ඉදිරිපත් කරන ලද වාර්තාව අනුව ගබඩා භාණ්ඩ 59 ක් සහ පුස්තකාල පොත් 595 ක් පලුදුවී තිබූ බව සඳහන්කර තිබුණද එ සම්බන්ධයෙන් විගණන දිනය වන 2015 සැප්තැම්බර් 02 දින දක්වා කටයුතු කර නොතිබුණි.

(ඈ) 2013 වර්ෂයට පෙර කාලපරිච්ඡේදයට අදාලව හිඟ වරිපනම් බදු රු. 7,922,707 ක මුදලින් රු. 872,688 ක් අයකර ගැනීම වෙනුවෙන් 12% කොමිස් මුදලක් වශයෙන් රු. 104,723 ක් ගෙවීම් කළයුතුව තිබුණද සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අයකරගත් රු. 231,975 ක් සඳහාවූ කොමිස් මුදල එකතුව රු. 132,560 ක් ගෙවීම්කර තිබුණි. මේ අනුව රු. 27,837 ක් වැඩිපුර ගෙවා තිබුණි.

3.2 නිෂ්ක්‍රිය වත්කම්

------------------

පහත නිරීක්ෂනයන් කරනු ලැබේ.

(අ) මහජන පොළ වෙළද සංකීර්ණයේ තිබෙන කඩ කාමර 64 ක ඉදිකිරීම් කටයුතු වර්ෂ දෙකකට පෙර නිමකර තිබුණද, කඩ කාමර 06 ක් බදු දීමට මෙතෙක් කටයුතු නොකර නිෂ්කාර්යව තිබුණි.

(ආ) පුරනැගුම(නෙල්ෂිප්) වැඩ සටහනේ මූල්‍ය ප්‍රතිපාදනය යටතේ රු. 15,013,071 ක වියදමින් සම්මාන්තුරෙයිහි ඉදිකරන ලද ඝාතකාගාරයේ ඝාතනය කරනු ලබන සතුන්ගේ අපද්‍රව්‍ය අස්කිරීම සඳහා සැලැසුම් කර නොතිබීමෙන් විගණන දිනය වන 2015 සැප්තැම්බර් 02 දිනය දක්වා ප්‍රයෝජනයට නොගෙන නිෂ්ක්‍රියව තිබුණි.

4 පද්ධති හා පාලන

--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ස්ථාවර වත්කම් පාලනය

(ඇ) ආදායම් පරිපාලනය